# 14 සසඳ සසඳ හඳපානේ අපි යනවා

උගතුන් අතර පැතිරුණු සිංහල කවිය සංස්කෘත භාෂා ඥානය හා පොත් පත් මගින් උකහා ගත් දැනුම මත සකස් වූවකි. සිංහලය හැර වෙනත් භාෂා නොදත්, පොතපතෙහි පැතිරුණු දැනුමක් නැති පොදු ජනයා අතර ද කවි සම්ප්‍රදායක් විය. එය ජන කවිය නමින් හැඳින්වෙයි. ගැමියාගේ එදිනෙදා ජීවිතය ඇසුරෙන් ලද අත්දැකීම් පාදක කරගෙන බිහි වූ ජන කවි බොහෝ ය. ජන කවියෙන් ගැමියාගේ දුක, සතුට, තනිකම ආදි හැඟීම් ප්‍රකාශ කර ඇත. විවිධ වෘත්තීන් ඇසුරෙන් නිර්මාණය වී ඇති ජන කවි අතර පැල් කවි, ගැල් කවි, නෙළුම් කවි, පාරු කවි ආදිය දැකිය හැකි ය. මෙම පාඩමට ඇතුළත් වන්නේ ගැල් කරුවන්ගේ වෘත්තිය ඇසුරු කරගෙන නිර්මාණය වූ ජන කවි ය.

තණ්ඩලේ දෙන්න දෙපොළේ දක්කනවා
කටුකැලේ ගාලෙ නොලිහා වද දෙනවා
හපුතලේ කන්ද දැකලා බඩ දනවා
පව් කළ ගොනෝ ඇදපන් හපුතල් යනවා

ආරන්නේ පඳුර වට කර දලු ලන්ට
පීරන්නේ වරල තෙල් ගා ඔප වෙන්ට
මෝරන්නේ හඳේ කරුවල වැඩි වෙන්ට
තේරෙන්නේ නැද්ද මේ දුක දෙවියන්ට

සසඳ සසඳ අපි හඳපානේ යනවා
මම්මල බඳට ගොන් බානක් දක්කනවා
සත්සිය සගවුවට රෝදේ කැරකෙනවා
දත් කැකුළට අපි කුරුණෑගල් යනවා

එගොඩ ගොඩේ නා කණුවේ බැන්ද ගොනා
මෙගොඩ ගොඩේ සපු කණුවේ බැන්ද ගොනා
දෙගොඩ තලා යන වතුරට පැන්න ගොනා
අනේ මගේ රන්මුතු වල්ලියා ගොනා


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

කළුගල් තළාලයි පාරට දමන්නේ
එම ගල් පැගිලයි ගොන් කුර ගෙවෙන්නේ
ගොනා නොවෙයි හරකයි බර අදින්නේ
කිරිගල් පොත්ත කන්දයි මේ ගෙවෙන්නේ

වයිර ගොනා දණ ගහලා අදින කොට
මයිල ගොනා පැන්නයි පස්සට හොරට
මොකද කරන්නේ පූරුවේ කළ පවට
පව් කළ ගොනෝ ඇදපන් ගාල ගාවට

බතට කන්න බැරි බතලේ ගල කන්ද
අලට කන්ට බැරි අලගල්ලේ කන්ද
නූනට කන්ට බැරි හුන්නස් ගිරි කන්ද
මෙකඳු තුනට නායක සමනල කන්ද

කඳු ඇදලා දෙපයට සවි නැත ඉතිනේ
බර ඇදලා ඉල ඇට පොඩිවිය තදිනේ
දුක සිතිලා ගම නෑයන් මතක් උණේ
ගම ඉඳලා වත් පණ යන්න නොලැබුණේ

## අවබෝධය

1. "හපුතලේ කන්ද දැකලා බඩ දනවා" යන පද්‍ය පාඨයෙන් හැඟවෙන ව්‍යංග්‍යාර්ථය කුමක් ද?
2. ගැල්කරු සහ ගොනා විඳි දුක් ගැහැට වඩාත් ගම්‍ය වන කවිය උපුටා දක්වන්න.
3. "එගොඩ ගොඩේ නා කණුවේ බැන්ද ගොනා ..." යන කවියෙන් කියැවෙන සිදුවීම විස්තර කරන්න.

## ලිඛිත අභ්‍යාස

1. පහත දැක්වෙන නාම පදවල බහු වචන පද ලියන්න.
   ගොනා, හරකා, නෑයා, ගස, පඳුර, කණුව, කළුගල, පාර, කන්ද,
2. පහත දැක්වෙන පදවලට සමානාර්ථ දෙන පද පාඩමෙන් උපුටා දක්වන්න.

| | | | |
|---|---|---|---|
| i. කොණ්ඩය - | | vi. කුලුන | - |
| ii. දොම්නස - | | vii. ඥාතීන් | - |
| iii. පෙර - | | viii. හිංසා | - |
| iv. මාර්ගය - | | ix. කුස | - |
| v. ශක්තිය - | | x. අන්ධකාරය | - |

## ප්‍රායෝගික අභ්‍යාස

1. මෙම කවි පෙළ තාලානුකූල ව ගායනා කරන්න.
2. විවිධ වෘත්තීන් ආශ්‍රිත ව ලියවුණු ජන කවි එකතු කොට කුඩා පොතක් සකස් කරන්න.
3. "ගැල්කරුවකුගේ ජීවිතය" යන මැයෙන් රචනයක් ලියන්න.
4. පහත දැක්වෙන රූපයට සම්බන්ධ ජන කවියක් සොයා ලියන්න.

